අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ඊඩී/05/72/01/04/03
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.11. 25

චක්‍රලේඛ අංකය : 24/ 2022

**අධ්‍යාපන අමාත්‍යාංශයේ,**

**අතිරේක ලේකම් (පාලන),**

**අතිරේක ලේකම් (අනධ්‍යන හා ඒකාබද්ධ සේවා),**

**අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා),**

**අතිරේක ලේකම් (ගුරු ආයතන),**

**සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,**

**ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන),**

**ජාතික පාසල් අධ්‍යක්ෂ,**

**<u>රාජකාරි වැඩ තහනම් කිරීම, අනිවාර්යය නිවාඩු ගැන්වීම හා නැවත සේවයේ පිහිටුවීම</u>**

රාජ්‍ය සේවයේ විවිධ තනතුරු දරන නිලධාරීන් විශාල පිරිසක් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු මධ්‍යස්ථාන ආදී ආයතනවල සේවය කරයි. ඔවුන් විවිධ විෂය ක්ෂේත්‍රවලට අයත් රාජකාරි ඉටු කරන බැවින් මෙම අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන ව්‍යුහය වඩාත් පුළුල්ව පවතියි.

02. මෙහිදී, ඒ එක් එක් නිලධාරීන්ගේ ආයතනික හා පරිපාලන කටයුතු අදාළ පරිදි ආයතනික කටයුතු භාර අංශ මගින් සිදු කරනු ලබයි. එහිදී ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 31 වගන්තිය යටතේ රාජකාරි වැඩ තහනම් කිරීම, ඒ ඒ ආයතනික අංශ වෙතින් සිදු කිරීම මත එකී නිලධාරීන් සම්බන්ධ ඉදිරි විනය කටයුතුවල දී පහත ගැටළු බහුල වශයෙන් ඇති වන බව පසුගිය කාලය පුරා නිරීක්ෂණය විය.

i. රාජකාරි වැඩ තහනමට ලක් වූ නිලධාරීන් සම්බන්ධව ඉදිරි විනය කටයුතු මගහැරී යාම
ii. ඒ හේතුවෙන් රාජකාරි වැඩ තහනමට ලක් වූ නිලධාරියාට අසාධාරණයක් වීම
iii. වැඩ තහනම කරනු ලබන ආයතන සංග්‍රහයේ වගන්තිය නිවැරදිව සඳහන් නොවීම මත ඉදිරි විනය කටයුතු කිරීම ඵලරහිත වීම

03. අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරන සියළුම සේවාවන්හි නිලධාරීන් විෂයෙහි විමර්ශන පැවැත්වීම හා විනය කටයුතු සඳහා වෙනම අංශයක් පිහිටුවා ක්‍රියාත්මක වේ. ඉහත තත්ත්වය මගහරවා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු මධ්‍යස්ථාන යනාදියේ සේවය කරන සියළුම තනතුරු/ සේවාවන්ට අයත් නිලධාරීන් සම්බන්ධයෙන් වන රාජකාරි වැඩ

තහනම් කිරීම (අධ්‍යාපන ලේකම් විනය බලධාරියා නොවන අවස්ථාවලදී අදාල විනය බලධාරියාගේ ආවරණ අනුමැතියට යටත්ව) අනිවාර්යය නිවාඩු ගැන්වීම සහ නැවත සේවයේ පිහිටුවීම යන කාර්යයන් මින් ඉදිරියට අධ්‍යාපන අමාත්‍යාංශයේ විනය අංශය මගින් සිදු කරනු ඇත.

04. ඒ අනුව මින් ඉදිරියට යම් නිලධාරියෙකු විෂයෙහි රාජකාරි වැඩ තහනම් කිරීමට පියවර ගතයුතු නම්, ඒ සඳහා වන හේතු සාධක පැහැදිළිව සඳහන් කර අදාළ ලේඛනවල මුල් පිටපත්/ සහතික කළ පිටපත් සමඟ, අදාළ පරිදි අංශය භාර අතිරේක ලේකම්ගේ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශයන් සමඟ නොපමාව අතිරේක ලේකම් (පාලන) වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. යම් නිලධාරියෙකු රක්ෂිත බන්ධනාගාරගත කර සිටින කාලයට අදාළව අනිවාර්යය නිවාඩු ගැන්වීම් සිදු කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් කලාප භාර නිලධාරීන් හෝ පොලිස් නිලධාරීන් හෝ වෙතින් ඔබ වෙත ලැබෙන මුල් ලිපිය/ සහතික කළ පිටපත අතිරේක ලේකම් (පාලන) වෙත යොමු කළ යුතු වේ.

06. යම් නිලධාරියෙකු පොලිස් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකුගේ හෝ අත්අඩංගුවට පත් වූ බව තමාට වාර්තා වූ වහාම ඒ බව ආයතන ප්‍රධානියා විසින් ෆැක්ස් අංක 0112785491/0112784846 මඟින් නොපමාව අධ්‍යාපන ලේකම්ට දැනුවත් කිරීමට කටයුතු කළ යුතු වේ.

එමෙන්ම ඉහත 04 හා 05 ඡේදයේ පරිදි කටයුතු කිරීමට අදාළ නිලධාරියා විසින් සිදුකර ඇති වරද/විෂමාචාරය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සියල්ල අතිරේක ලේකම් (පාලන) වෙත මුල් අවස්ථාවේදීම එවීමට අදාල බලධාරීන් විසින් කටයුතු කළ යුතු වේ.

i. අත්අඩංගුවට ගත් දිනය
ii. ඇප මත නිදහස් කළ දිනය
iii. රක්ෂිත බන්ධනාගාරගත කළ කාලය
iv. වරදෙහි ස්වභාවය
v. ඉදිරිපත් කළ අධිකරණය, නඩු අංකය හා දිනය
vi. නීතියේ වගන්තිය
vii. මෙතෙක් නඩු පවරා ඇත්ද/ නැද්ද යන වග
viii. අදාළ නිලධාරියා මේ වන විට සේවයට වාර්තා කරන්නේ ද යන වග
ix. එසේ නොමැතිනම් අවසන් වරට සේවයට වාර්තා කළ දිනය
x. මෙම නිලධාරියා සම්බන්ධයෙන් වෙනත් නඩුවක්/ නීති කෘත්‍යයක් පවතින්නේද යන වග
xi. නිලධාරියාගේ පැමිණීම, වැඩ හැසිරීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ

ඉහත තොරතුරු සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත්/සහතික කළ පිටපත් එවීමට කටයුතු කළ යුතුය.

07. රාජකාරී වැඩ තහනම් කිරීමේ ලිපිය නිකුත් කළ පසු, එහි පෞද්ගලික ලිපිගොනුවට අදාළ පිටපත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීමට පෞද්ගලික ලිපිගොනු භාරව කටයුතු කරන බලධරයා විසින් අනිවාර්යයෙන් කටයුතු කළ යුතුය. එසේ කටයුතු කිරීමෙන් අනතුරුව ඒ බව අතිරේක ලේකම් (පාලන) වෙත තහවුරු කර දන්වා එවිය යුතුය. මේ සඳහා වන ආකෘති පත්‍රයක් / උපදෙස්, වැඩ තහනම් කිරීමේ ලිපිය සමග ඔබ වෙත එවීමට කටයුතු කරනු ඇත.

08. රාජකාරී වැඩ තහනම් කරනු ලැබ ඇති නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීමේදී ඔහු ස්ථානගත කළයුතු සේවා ස්ථානය නම් කිරීම හා ඒ සම්බන්ධ නිර්දේශ ලබා දීම විනය නියෝගයේ සඳහන් කොන්දේසිවලට යටත්ව එම නිලධාරියා අයත් තනතුරේ/ සේවයේ, ආයතනික/ පරිපාලන කටයුතු භාර අතිරේක ලේකම්/ අංශ ප්‍රධානී විසින් සිදු කර විනය අංශය වෙත නොපමාව දැන්විය යුතු ය. විනය අංශයෙන් මේ සම්බන්ධ විමසීමක් ලදවිට ඊට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට අදාළ අතිරේක ලේකම්/ අංශ ප්‍රධානී විසින් කටයුතු කළ යුතුය. අදාළ තොරතුරු ලද පසු නැවත සේවයේ පිහිටුවීමේ ලිපිය විනය අංශය මගින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

09. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් යම් පැහැදිළි කර ගැනීමක් අවශ්‍ය වේ නම්, අතිරේක ලේකම් (පාලන) ඇමතීමෙන් ලබාගත හැකිය.


**එම්.එන්. රණසිංහ**

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

දු.ක.අංක : 0112784811

ෆැක්ස් අංක : 0112785162

ඊමේල් : secretary.education@moe.gov.lk


පිටපත් :

1. **විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය**
2. **ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**
3. **ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
4. **ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අතිරේක ලේකම්වරුන්, **අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ප්‍රධාන මූල්‍ය නිලධාරීන්**

} **කරු. දැ.ගැ.සඳහා**